# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2011/25 - 2017 මාර්තු මස 24 වැනි සිකුරාදා - 2017.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

**1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

උතුරු පළාතේ පළාත් පාලන ආයතන සඳහා සම්මත කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා

1989 වසරේ අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය සමඟ කියවිය යුතු 1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා විනය, ඉඩම්, සමාජ සේවා හා පුනරුත්ථාපන, කාන්තා කටයුතු, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන, සංචාරක, පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍ය ක. වි. විග්නේශ්වරන් වන මවිසින් සාදන ලද.

1. උතුරු පළාත් මහා නගර සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා (1 සිට 6 දක්වා වූ අධිකාරය) 2016.02.02 වැනි දින අංක 1952/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ද,
2. උතුරු පළාත් නගර සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා (1 සිට 6 දක්වා වූ අධිකාරය) 2016.02.02 වැනි දින අංක 1952/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ද,
3. උතුරු පළාත් ප්‍රාදේශීය සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා (1 සිට 6 දක්වා වූ අධිකාරය) 2016.02.02 වැනි දින අංක 1952/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ද පළ කර ඇත.

උතුරු පළාතේ වූ මහා නගර සභාවන්, නගර සභාවන් හා ප්‍රාදේශීය සභාවන් සඳහා ඉහත කී සම්මත අතුරු ව්‍යවස්ථා උතුරු පළාතේ, පළාත් සභාව වෙත ඉදිරිපත් කර, උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින සම්මත කළ බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ක. වි. විග්නේශ්වරන්,
ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා විනය,
ඉඩම්, සමාජ සේවා හා පුනරුත්ථාපන, කාන්තා කටයුතු, විදුලිබල,
නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන, සංචාරක, පළාත් පාලන
හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍ය

2017 මාර්තු මස 15 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය අමාත්‍යාංශය,
A-9 පාර, කයිතඩි.

04-144

1A PG 3465 — 52 (03/2017) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*